ආර්ථික අර්බුදය හේතුවෙන් දරු දෙදෙනාව ද ඝාතනය කිරීමේ ප්‍රයත්නයක් සමඟින් දිවි තොර කරගැනීමට උත්සාහ ගත් මවක සම්බන්ධයෙන් මාධ්‍ය අවධානය යොමුවී තිබිණි.

එය වාර්තා කළ අරුණ ලිපිය තුළ, දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී පිළිපැදීම අත්‍යවශ්‍ය වන ආචාර ධර්ම කිහිපයක්ම උල්ලංඝනය වී තිබිණි.

1) ඝාතන-දිවි තොර කර ගැනීමට උත්සාහ ගත් ආකාරය සඳහන් කරයි.

2) එසේම, එම ආකාරය දිගින් දිගටම විස්තර කරයි.

3) දිවි තොර කරගැනීමට තැත් කළ අයට දෝෂාරෝපණය එල්ල කරයි.

4) හදිසි උපකාරක අංක සඳහන් නොකරයි.

දිවි තොර කරගැනීම් වාර්තා කිරීම පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන් පවසන්නේ, ඝාතන-දිවි තොර කරගැනීමට තැත් කිරීම් සඳහා ප්‍රමුඛ අවධානයක් යොමු වන බැවින්, එවැනි සිදුවීම් වාර්තා කිරීමේදීද මාධ්‍ය ආචාර ධර්ම පිළිපැදීම අත්‍යවශ්‍ය බවයි. එය අනුකාරක සිදුවීම් අවම කිරීම සඳහා ද හේතු වන බවයි.

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැකගනිමු!

(එදින අරුණ පුවත්පතේ සහෝදර ඉංග්‍රීසි භාෂා පුවත්පත තුළ මේ සම්බන්ධයෙන් වාර්තා වී නොතිබුණි.)

හදිසි උපකාරක අංක:

* CCCline - 1333

* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308

* ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:

https://media.samaritans.org/documents/Guidance_for_reporting_on_a_murder-suicide_FINAL.pdf

https://www.nsrf.ie/wp-content/uploads/2021/06/Briefing_Murder-suicide_NSRF_26-02-2021-Final-1-1.pdf

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.